මගේ අංක : ඩී2/ජේ. උසස් වීම් (ජ්‍යෝෂ්ඨතාවය)

බන්ධනාගාර මූලස්ථානය,

බේස්ලයින් පාර,

කොළඹ 09.

2016.04. 27

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ,

සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර සැරයන් නිළධාරීන් II පෙළ ජේලර් තනතුරට ජ්‍යෝෂ්ඨතාවය හා කුසලතාවය මත උසස් කිරීම - 2016**

මෙම දෙපාර්තමේන්තුවේ පවතින II පෙළ ජේලර් තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා තනතුරේ ස්ථිර කර ඇති, 2007.02.10 දිනයට හෝ ඊට පෙර බන්ධනාගාර සැරයන් තනතුරට පත් වූ නිලධාරීන්ගෙන් හා නිලධාරිනියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25% ක් ජ්‍යෝෂ්ඨත්වය හා කුසලතාවය මතද ඉතිරි 25% සීමිත තරග විභාගයකින් (ලිඛිත) තෝරා ගනු ලැබේ. ඉතිරි 50% බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරණු ලැබේ.

03. ඒ අනුව ජ්‍යෝෂ්ඨතාවය මත II පෙළ ජේලර් (පිරිමි) තනතුරු 16 ක් සහ II පෙළ ජේලර් (කාන්තා) තනතුරු 01 සම්පූර්ණ කිරීමට නියමිතය. (පවත්නා පුරප්පාඩු අනුව 1:5 අනුපාතයට සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ)

04. වැටුප් බණ්ඩය හා පරිමානය :-

I. වැටුප් බණ්ඩය - RS-3-2016 PS රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව

II. වැටුප් බණ්ඩය - 32790 - 7 x 370 - 2 x 495 - 25 x 660 - 52870

05. කාර්යක්ෂමතා කඩඉම් :-

I. I වන කාර්යක්ෂමතා කඩඉම II පෙළ ජේලර් තනතුරට පත්ව වසර තුනක් (3) ගතවීමට පෙර සමත් විය යුතුය.

II. II වන කාර්යක්ෂමතා කඩඉම II පෙළ ජේලර් තනතුරට පත්ව වසර හතක් (7) ගතවීමට පෙර සමත් විය යුතුය.

06. II පෙළ ජේලර් තනතුරේ උසස් කිරීමේ ක්‍රමවේදය :-

**06.I ජ්‍යෝෂ්ඨත්වය හා කුසලතාවය මත II පෙළ ජේලර් තනතුර උසස් කිරීම.**

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25% ක් ජ්‍යෝෂ්ඨත්වය හා කුසලතාවය මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් II පෙළ ජේලර් තනතුරට උසස් කරනු ලැබේ. උපරිම ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා උසස් කරනු ලැබේ. තවද සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පත්වීමක් ලැබීමට සුදුසුකමක් නොවේ.

**06.I.1. සපුරා ලිය යුතු මූලික සුදුසුකම් :-**

I. පත්වීම් ස්ථිර කර තිබීම.

II. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.

III. උසස් කිරීමේ දිනට සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 05 උපයා ගෙන තිබිය යුතුය.

සටහන් :-

✓ සතුටුදායක සේවා කාලයක් යනු :

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි XVII වැනි පරිච්ජේයේ 186(I) වගන්තිය අනුව රජයේ නිළධාරියක් විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරිම මගින්ද,සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්විම මගින්ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරිම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරිම මගින්ද,එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ ඔහු විසින් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි XVII වැනි පරිච්ජේදයේ 186(II) වගන්තිය අනුව නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට,නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ජේදයක් වේ නම් එයද, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛන යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර තුනක කලයක්ද, සහ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

**06.I.2. අයදුම්පත් යොමු කල යුතු ආකාරය :-**

✓. ඉහත දක්වා ඇති මූලික සුදුසුකම් කර ඇති නිළධාරින් සම්බන්ධව මෙම නිවේදනය අවසානයේ, ඇමුණුම් අංක 1 ලෙස අමුණා ඇති ආදර්ශ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ඔබගේ නිර්දේශය සහිතව (නම සහිත නිල මුද්‍රාව තබා නිර්දේශ කල යුතු වේ.) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2016.05.10 දිනට ප්‍රථම ලැබෙන සේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත එවිය යුතුය.

✓. නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන අයදුම්පත්, නිසි ලෙස නොකරන ලද එමෙන්ම නියමිත දිනයට පසුව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ

06.I.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමවේදය (ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ) :-

තේරීම් පරිපාටිය හා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙන ක්‍රමය

<u>සුදුසුකම්</u>

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 1:5 අනුපාතය යටතේ ජ්‍යෙෂ්ඨතම ඔවසියර්වරුන් සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර, අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්නයේ වසර 05 තුල සියලු වැටුප් වර්ධක උපයා ගත්, එම කාලය තුල අවවාද කිරීමකට වැඩි දඬුවමක් ලබා නොතිබිය යුතුය.

අභ්‍යන්තර උසස්වීම් වලදී වර්ථමාන තනතුරේ සේවා කාලය සඳහා පමණක් ලකුණු ලබා දෙන බැවින් නියාමක තනතුරෙ සේවා කාලය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොවේ. එසේම විදේශ නිවාඩු ලබා විදේශ ගත වූ කාලය ක්‍රියාකාරී සේවයක් ලෙස නොසැලකේ. එම කාලය ලකුණු ලබාදීමක් සිදු නොවේ.

| | |
|---|---|
| <u>ජ්‍යෙෂ්ඨත්වය සඳහා</u> | <u>උපරිම ලකුණු 70 යි</u> |
| සැරයන් තනතුරේ එක් අවුරුදු සේවා කාලයක් සඳහා | ලකුණු 03 යි. |
| මාස 06 කට හෝ ඊට වැඩි කාලයක් සඳහා | ලකුණු 1 ½ යි |
| <u>කුසලතාවය සඳහා</u> | <u>උපරිම ලකුණු 30 යි</u> |
| වර්තමාන තනතුරට අදාල සහතික පමණි | |
| <u>ප්‍රශංසා</u> | <u>උපරිම ලකුණු 05 යි</u> |
| බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දෙන ලද ප්‍රශංසාවකට | ලකුණු 02 යි |
| බන්ධනාගාර අධිකාරී ප්‍රශංසාවකට | ලකුණු 01 යි |

වර්තමාන තනතුරට පත්වීම් ලද දින සිට නිලධාරියාට විරුද්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද දෝෂ දර්ශනයකට ලකුණු 02ක් සහ බන්ධනාගාර අධිකාරී විසින් පත්කරන ලද දෝෂ දර්ශනයකට ලකුණු 01 ක් බැගින් අඩු කෙරේ.

| | | |
|---|---|---|
| <u>ක්‍රීඩා</u> | | <u>උපරිම ලකුණු 10 යි</u> |
| I. | බන්ධනාගාරය නියෝජනය එක් ක්‍රීඩාවකට | ලකුණු 01 |
| II. | දෙපාර්තමේන්තුව නියෝජනය එක් ක්‍රීඩාවකට | ලකුණු 02 |
| III. | රාජ්‍ය සේවා නියෝජනය එක් ක්‍රීඩාවකට | ලකුණු 03 |
| IV. | මව් රට නියෝජනය එක් ක්‍රීඩාවකට<br>(නියෝජනය සඳහා ලකුණු ලබා දීම සිදුවේ) | ලකුණු 05 |

<u>සේවයට වාර්තා කිරීම</u> <u>උපරිම ලකුණු 05 යි</u>

| | | |
|---|---|---|
| I. | වර්ෂයකට දින 300 හෝ ඊට වඩා දින ගණනක් සේවයට වාර්තා කර ඇත්නම් ලකුණු | ලකුණු 01 |
| II. | වර්ෂයකදී දින 300 – 270 ක් අතර සේවයට වාර්තා කර ඇත්නම් | ලකුණු ½ |
| III. | වර්ෂයකදී සේවය කළ දින 207 – 250 අතර දින ගණනක් සේවයට වාර්තා කර ඇත්නම් | ලකුණු ¼ |

වර්ෂයක දී සේවය කළ දින ගණන 250ට අඩු නම් එම වර්ෂය සඳහා ලකුණු දීමක් සිදු නොවේ.
(ලකුණු ලබා දීම සිදුවන්නේ අවසාන පස් අවුරුදු සේවා කාලය සඳහා පමණකි.)

<u>සුභ සාධක හා ආගමික සේවා වෙනුවෙන් - උපරිම ලකුණු 05 යි</u>

| | | |
|---|---|---|
| I. | බෞද්ධ සංගමය, සුභ සාධක සංගමය, දෙපාර්තමේන්තු නිලධාරීන් හවුල් සංගමය වැනි දෙපාර්තමේන්තු මට්ටමේ සමිතියක හෝ සංගමයක සභාපති/ලේකම්/භාණ්ඩාගාරික වැනි තනතුරකට | ලකුණු 02 |
| II. | වෙනත් තනතුරකට | ලකුණු 01 |
| III. | ඉහත පරිදි ආයතන මට්ටමේ සමිතියක හෝ සමාගමක සභාපති/ලේකම්/භාණ්ඩාගාරික තනතුර සඳහා | ලකුණු 01 |
| IV. | වෙනත් තනතුරක් සඳහා | ලකුණු 01 |

<u>දැරූ වගකීම් ආදිය සඳහා උපරිම ලකුණු 05 යි</u>

මේ යටතේ ආයතන තුල විවිධ කාර්යාලවල හා ගබඩා අංශය, විනය අංශය, කාර්මාන්ත අංශය, ගිණුම් අංශය වැනි අංශ භාරව හෝ එහි අංශ භාර සහකාර වරයෙකු ලෙස හෝ සේවය කිරීම යටත් සේවා ස්ථාන අධිකාරි වාර්තාව යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

## ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත II පෙළ ජේලර් තනතුරට උසස් කිරීම - අයදුම්පත්‍රය

පුද්ගලික ලිපිගොනු අංකය :- ..................

1. නිලධාරියාගේ / නිලධාරිනියගේ නම :- ..........................................................................................................

2. ස්ථිර සැරයන් තනතුරට පත් වූ දිනය :- ..........................................................................................

I. 2016.03.31 වෙනි දිනට සැරයන් තනතුරේ සේවා කාලය :- අවු : ..........මාස: ..........දින: ........

II.තනතුර ස්ථිර කර ඇති ලිපියේ අංකය :-..............................................................................................

III.ජ්‍යෙෂ්ඨත්වය පහත හෙළා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :- ....................................................................

3. I. ප්‍රශංසා ( සැරයන් කාලය තුළ) :- ..........................................................................................................

II.2016.03.31 දිනට සැරයන් තනතුරට අදාල කාලය තුල දෝෂ දර්ශනයට ලක්වී තිබේද ? ඔව්/නැත

(ඔව් නම් දිනය ඇතුලත් විස්තරයන් සඳහන් කරන්න) :-

..........................................................................................................................................................

4. I. ඔබට විරුද්ධව මේ වන විට මූලික විමර්ශනයක් ,විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබේද? ඔව්/ නැත

(ඔව් නම් විස්තර සඳහන් කරන්න) :- ..........................................................................................

II. චෝදනා පත්‍රයක් නිකුත්කර තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න.

5. 2016.03.31 වෙනි දිනට පූර්වාසන්නයේ වසර 05 තුල වැටුප් වර්ධක උපයාගෙන තිබේද ? ඔව්/නැත

( පිළිතුර නැත නම් විස්තර සඳහන් කළ යුතුය)

6.I. වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇත්නම් එම විස්තර :- ........................................................................

..........................................................................................................................................................

II. ලබාගෙන ඇති අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර :- ........................................................

..........................................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : ................................................ අයදුම්කරුගේ අත්සන : ..........................................

**<u>බන්ධනාගාර අධිකාරි විසින් සම්පූර්ණ කල යුතුය.</u>**

1) ඉහත 1 හා 6 දක්වා නිලධාරියා විසින් සඳහන් කර ඇති කරුණු නිවැරදි නොවන්නේ නම් නිවැරදි තොරතුරු ඇතුලත් කරන්න.

2) බන්ධනාගාර සැරයන් තනතුරට අදාළ සේවා කාලය තුළ ලබා ඇති

<u>ප්‍රශංසා ගණන</u>

I. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

II. බන්ධනාගාර අධිකාරි

<u>දෝෂ දර්ශන ගණන</u>

I. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

II. බන්ධනාගාර අධිකාරි

3) පැමිණීමේ දින ගණන :-

2011.04.01 සිට 2012. 03.31 දක්වා දින ගණන -

2012.04.01 සිට 2013. 03.31 දක්වා දින ගණන -

2013.04.01 සිට 2014. 03.31 දක්වා දින ගණන -

2014.04.01 සිට 2015. 03.31 දක්වා දින ගණන -

2015.04.01 සිට 2016. 03.31 දක්වා දින ගණන -

ඉහත නම සඳහන් නිලධාරියා/ නිලධාරිනිය මෙම ආයතනයේ සේවය කරන බවත්, 2016.03.31 දිනට පූර්වාසන්න වසර 05 තල සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, පූර්වාසන්න වසර 03 තුළ අවවාද කිරීමකට වඩා වැඩි දඬුවමක් ලබා නොමැති බවත් නිලධාරියාට විරුද්ධව පැමිණිල්ලක් ලැබීමක් හෝ ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුත්තක් සිදු නොවන බවත් සහතික කරන අතර, නිලධාරියා/ නිලධාරිනියගේ වැඩ , පැමිණීම සතුටුදායක බැවින් II පෙළ ජේලර් තනතුරට උසස් කිරීමට නිර්දේශ කරමි.

දිනය : .......................................... බන්ධනාගාර අධිකාරි : ...........................................